# ඡට්ඨමො පාඨො

## දුට්ඨගාමිණී රාජා



දුට්ඨගාමිණි රාජා කාකවණ්ණතිස්සරඤ්ඤො ජෙට්ඨපුත්තො. තස්ස මාතා විහාරමහාදෙවී. භාතා සද්ධාතිස්සො නාම. දහරකාලෙ තස්ස ජෙට්ඨස්ස ගාමිණි ඉති නාමං අකංසු. කුමාරස්ස ද්වාදසවස්සිකකාලෙ එකදා අත්තනො පිතා උභො කුමාරෙ ආමන්තෙත්වා දමිළෙහි සද්ධිං මා යුජ්ඣථා'ති වත්වා, භත්තපිණ්ඩං ගහෙත්වා ''අහං දමිළෙහි සද්ධිං න යුජ්ඣිස්සාමි'' ඉති සපථං කත්වා භුඤ්ජථා'ති පච්චෙකං අදාසි. ගාමිණිකුමාරො තං භත්තපිණ්ඩං භූමියං ඛිපිත්වා සයනං ගන්ත්වා, හත්ථපාදෙ සංකුචිත්වා නිපජ්ජි. කුමාරස්ස මාතා විහාරමහාදෙවී තං දිස්වා සන්තිකං ගන්ත්වා කිමත්ථං එවං සයසී'ති පුච්ඡි. කුමාරො ''උත්තරදිසායං දමිළා, දක්ඛිණපස්සෙ ගොඨසමුද්දො. කථං සුඛෙනා'හං සයාමීති'' ආහ. කුමාරො පන ''මයි වයප්පත්තෙ දමිළෙහි සද්ධිං යුජ්ඣිස්සාමී''ති චින්තෙසි.

(පාලි රචනා 2)

**පදමාලාව**

**දුට්ඨගාමිණිරාජා** - දුටුගැමුණු රජතුමා
**රඤ්ඤො** - රජතුමාගේ
**ජෙට්ඨපුත්තො** - වැඩිමහල් පුතා

| | | |
|---|---|---|
| තස්ස මාතා | - | ඔහුගේ මව |
| භාතා | - | සහෝදරයා |
| දහරකාලෙ | - | ළදරු කාලයෙහි |
| නාමං අකංසු | - | නම් කළහ |
| ද්වාදසවස්සිකකාලෙ | - | දොළොස් හැවිරිදි කාලයේ |
| අත්තනො | - | තමාගේ |
| උභො කුමාරෙ | - | කුමාරයන් දෙදෙනා |
| ආමන්තෙත්වා | - | ආමන්ත්‍රණය කොට |
| දමිළෙහි සද්ධිං | - | දෙමළුන් සමඟ |
| මා යුජ්ඣථා'ති | - | යුද්ධ නොකරව් යැයි |
| භුඤ්ජථාති | - | අනුභව කරව් යැයි |
| පච්චෙකං | - | එකිනෙකාට |
| භත්තපිණ්ඩං | - | බත්පිඬක් |
| බිපිත්වා | - | දමා |
| හත්ථපාදෙ | - | අත්පා |
| සංකුචිත්වා | - | හකුළා |
| නිපජ්ජි | - | හුන්නේය |
| කිමත්ථං | - | කුමක් නිසා |
| පුච්ඡි | - | විචාළේය |
| උත්තරදිසායං | - | උතුරු දිසාවේ |
| දක්ඛිණපසෙස | - | දකුණු ප්‍රදේශයේ |
| ගොඨසමුද්දො | - | ගොළු මුහුද |
| සුඛෙන | - | සුවෙන් |
| සයාමී'ති | - | නිදමි යැයි |
| වයප්පත්තෙන | - | වයසට පැමිණි කල්හි |
| චින්තෙසි | - | සිතීය |

## අභ්‍යාස

කති - කී දෙනෙක්　　කා - කවර තැනැත්තියක්　　කිං - කුමක්

කස්මා - කවර හෙයින්　　කෙන හෙතුනා - කුමන හේතුවකින්

1. 'දුට්ඨගාමණී රාජා' ඡේදය සිංහලට නගන්න.
2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා:- **කො දමිළෙහි සද්ධිං යුජ්ඣිස්සාමා'ති චින්තෙසි?**
**දුට්ඨගාමිණීරාජා දමිළෙහි සද්ධිං යුජ්ඣිස්සාමී'ති චින්තෙසි.**

i. කාකවණ්ණතිස්සරඤ්ඤො කති පුත්තා අහෙසුං ?
ii. කා දුට්ඨගාමිණී කුමාරස්ස මාතා?
iii. උභො කුමාරෙ ආමන්තෙත්වා රාජා කිං අවදි?
iv. ගාමිණීකුමාරො භත්තපිණ්ඩං භූමියං ඛිපිත්වා කිං අකාසි ?
v. ගාමිණීකුමාරො මාතරං කිං අවදි?
vi. ගාමිණීකුමාරො කිං චින්තෙසි?
vii. කාකවණ්ණතිස්සරාජා උභයෙසං පුත්තානං කති භත්තපිණ්ඩානි අදාසි?
viii. කාකවණ්ණතිස්සො ගාමිණීකුමාරස්ස කස්මා කුජ්ඣි?
ix. කෙන හෙතුනා ගාමිණීකුමාරො දුට්ඨගාමිණී'ති පඤ්ඤායි ?
x. කස්මා දුට්ඨගාමිණී දමිළෙහි සද්ධිං යුජ්ඣි?

## විශේෂ අකාරාන්ත ශබ්ද

නාමයක් විභක්ති නවයෙහි සහ ඒකවචන බහුවචන දෙක්හි වරනැඟෙයි. පද නිවැරදි ව වාක්‍යවල යෙදවීමට ඒ ඒ විභක්තිරූප හා අර්ථ පිළිබඳ දැනුමක් තිබිය යුතු ය. මේ වන විටත් නාමයක් විභක්තිවල වරනැඟෙන ආකාරය ඔබ ඉගෙනගෙන තිබේ. නාමයක් අන්ත වශයෙන් සහ ලිංග වශයෙන් වෙනස් වන බවත් ඒ ඒ අන්තය සහ ලිංගය අනුව වරනැඟීම් වෙනස් වන ආකාරයත් යළි සිහිපත් කර ගැනීමට පහත දැක්වෙන වගු මනාව හදාරන්න.

1 වගුව

| ලිංගය | නාමය |
|---|---|
| පුල්ලිඞ්ගනාම | බුද්ධ, අත්ත, රාජ, ගුණවන්තු, අග්ගි, දණ්ඩී, භික්ඛු |
| ඉත්ථිලිඞ්ගනාම | කඤ්ඤා, රත්ති, ඉත්ථී, වධූ |
| නපුංසකලිඞ්ගනාම | ඵල, පුඤ්ඤ, චිත්ත, නයන |

## 2 වගුව

| ශබ්දාන්තය | පුල්ලිංග | ඉත්ථිලිංග | නපුංසකලිංග |
|---|---|---|---|
| අ කාරාන්ත | බුද්ධ | - | ඵල |
| ආ කාරාන්ත | සා | කඤ්ඤා | මුඛ |
| ඉ කාරාන්ත | අග්ගි | රත්ති | අට්ඨි |
| ඊ කාරාන්ත | දණ්ඩී | නදී | සුඛවිහාරී |
| උ කාරාන්ත | භික්ඛු | මාතු | ආයු |
| ඌ කාරාන්ත | අභිභූ | වධූ | ගොත්‍රභූ |
| ඔ කාරාන්ත | ගො | ගො | චිත්තගො |

## 3 වගුව - පුල්ලිංගනාම

| ශබ්දාන්තය | නාමය | පඨමා එකවචන | පඨමා බහුවචන |
|---|---|---|---|
| අ කාරාන්ත | බුද්ධ | බුද්ධො | බුද්ධා |
| ආ කාරාන්ත | සා | සා | සානො |
| ඉ කාරාන්ත | අග්ගි | අග්ගි | අග්ගී, අග්ගයො |
| ඊ කාරාන්ත | දණ්ඩී | දණ්ඩී | දණ්ඩී, දණ්ඩිනො |
| උ කාරාන්ත | භික්ඛු | භික්ඛු | භික්ඛූ, භික්ඛවො |
| ඌ කාරාන්ත | අභිභූ | අභිභූ | අභිභූ, අභිභුවො |
| ඔ කාරාන්ත | ගො | ගො | ගාවො |

## 4 වගුව - ඉත්ථිලිංග නාම

| ශබ්දාන්තය | නාමය | පඨමා එකවචන | පඨමා බහුවචන |
|---|---|---|---|
| ආ කාරාන්ත | කඤ්ඤා | කඤ්ඤා | කඤ්ඤායො |
| ඉ කාරාන්ත | රත්ති | රත්ති | රත්තියො |
| ඊ කාරාන්ත | නදී | නදී | නදියො |
| උ කාරාන්ත | මාතු | මාතා | මාතරො |
| ඌ කාරාන්ත | වධූ | වධූ | වධුයො |

## 5 වගුව - නපුංසක ලිංග නාම

| ශබ්දාන්තය | නාමය | පඨමා එකවචන | පඨමා බහුවචන |
|---|---|---|---|
| අ කාරාන්ත | චිත්ත | චිත්තං | චිත්තානි |
| ආ කාරාන්ත | - | - | - |
| ඉ කාරාන්ත | වාරි | වාරි | වාරීනි |
| ඊ කාරාන්ත | දණ්ඩී | දණ්ඩී | දණ්ඩීනි |
| උ කාරාන්ත | දාරු | දාරු | දාරූනි |
| ඌ කාරාන්ත | ධම්මඤ්ඤූ | ධම්මඤ්ඤූ | ධම්මඤ්ඤූනි |
| ඔ කාරාන්ත | චිත්තගො | චිත්තගු | චිත්තගූනි |

ඉහත වගු දෙස බලන විට නාම වරනැගීම් ශබ්දාන්ත සහ ලිංග වශයෙන් වෙනස් වන බව මනාව පැහැදිලි වේ. අකාරාන්ත පුල්ලිංග ශබ්ද වරනැගීම සමාන වුව ද ඇතැම් අකාරාන්ත පුල්ලිංග ශබ්ද වරනැගිමේදී වෙනත් ස්වරූපයක් ගන්නා බව ද පෙනේ. එම ශබ්ද **විශේෂ අකාරාන්ත ශබ්ද** ලෙස හඳුන්වමු. **බ්‍රහ්ම, අත්ත, සඛ, රාජ** යනු විශේෂ අකාරාන්ත ශබ්දයි. පහත දැක්වෙන වගුව බලන්න.

| නාමය | පඨමා එකවචන | පඨමා බහුවචන |
|---|---|---|
| බුද්ධ | බුද්ධො | බුද්ධා |
| බ්‍රහ්ම | බ්‍රහ්මා | බ්‍රහ්මානො |
| සඛ | සඛා | සඛායො |
| රාජ | රාජා | රාජානො |
| අත්ත | අත්තා | අත්තානො |

විශේෂ අකාරාන්ත ශබ්ද වරනැගීමේදී පඨමා විභක්ති ඒකවචන වෙනස් වන ආකාරය ඉහත වගුවෙන් දැක්වේ. මෙම වෙනස සෙසු විභක්තිවල ද සිදුවන බව බුද්ධ ශබ්දය හා සසඳා වරනැගීමෙන් තේරුම්ගත හැකි ය.

| විභක්තිය | නාමය | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| **පඨමා** | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධෝ<br>රාජා<br>අත්තා | බුද්ධා<br>රාජානෝ<br>අත්තානෝ |
| **ආලපන** | බුද්ධ<br>රාජ<br>අත්ත | හේ බුද්ධ<br>හේ රාජ<br>හේ අත්ත | හේ බුද්ධා<br>හේ රාජානෝ<br>හේ අත්තානෝ |
| **දුතියා** | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධං<br>රාජානං, රාජං<br>අත්තානං, අත්තං | බුද්ධේ<br>රාජානෝ<br>අත්තානෝ |
| **තතියා** | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධේන<br>රඤ්ඤා, රාජේන<br>අත්තේන, අත්තනා | බුද්ධේහි, බුද්ධේභි<br>රාජේහි, රාජේභි, රාජූහි, රාජූභි<br>අත්තනේහි, අත්තනේභි |
| **කරණ** | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධේන<br>රඤ්ඤා, රාජේන<br>අත්තේන, අත්තනා | බුද්ධේහි,බුද්ධේභි<br>රාජේහි,රාජේභි,රාජූහි,රාජූභි<br>අත්තනේහි,අත්තනේභි |
| **චතුත්ථී** | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධාය, බුද්ධස්ස<br>රඤ්ඤෝ, රාජිනෝ<br>අත්තනෝ | බුද්ධානං<br>රඤ්ඤං,රාජූනං,රාජානං<br>අත්තානං |
| **පඤ්චමී** | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා<br>රඤ්ඤා, රාජම්හා, රාජස්මා<br>අත්තනා | බුද්ධේහි, බුද්ධේභි<br>රාජේහි, රාජේභි, රාජූහි, රාජූභි<br>අත්තනේහි, අත්තනේභි |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | |
|---|---|---|---|
| ඡට්ඨී | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධස්ස<br>රඤ්ඤො, රාජිනො<br>අත්තනො | බුද්ධානං<br>රඤ්ඤං, රාජූනං, රාජානං<br>අත්තානං |
| සත්තමී | බුද්ධ<br>රාජ<br>අත්ත | බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං<br>රඤ්ඤෙ, රාජම්හි, රාජස්මිං<br>අත්තනි | බුද්ධෙසු<br>රාජෙසු, රාජූසු<br>අත්තනෙසු |

## අභ්‍යාස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ලිංග වශයෙන් නාම ප්‍රභේද කර දක්වන්න.
ii. අන්ත වශයෙන් නාම වර්ගගත කර දක්වන්න.
iii. විශේෂ අකාරාන්ත නාම හතක් ලියා දක්වන්න.

2. පහත දැක්වෙන නාමපදවල විභක්තිය සහ වචනය ලියා තේරුම දක්වන්න.

| නාමපදය | විභක්තිය | වචනය | තේරුම |
|---|---|---|---|
| රාජා | | | |
| රඤ්ඤො | | | |
| පුත්තො | | | |
| දෙවී | | | |
| භාතා | | | |
| ජෙට්ඨස්ස | | | |
| දමිළෙහි | | | |
| භත්තපිණ්ඩං | | | |
| භූමියං | | | |

3. විශේෂ අකාරාන්ත නාමපද යෙදුණු වාක්‍ය දහයක් සොයා ලියන්න.

4. අත්ත ශබ්දය සහ රාජ ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

5. පහත දැක්වෙන පාලි වාක්‍ය සිංහලට නගන්න.

i. බුද්ධො ධම්මං භාසති.
ii. ජෙට්ඨපුත්තා වීහිං මිණාති.
iii. භික්ඛවො අධිපතීනං ගාමං ගච්ඡන්ති.
iv. චොරා අධිපතිනො නිධිං හරන්ති.
v. රඤ්ඤො අසෙසා මග්ගෙ ධාවති.
vi. ඉසයො කවීනං ධම්මං දෙසෙන්ති.
vii. සානො අඞ්ගණම්හා ගෙහං ධාවන්ති
viii. අහං බුද්ධස්ස පාදෙ පූජෙමි.
ix. දුට්ඨගාමණීරාජා රට්ඨං පාලෙසි.
x. අරයො භටස්ස අසිම්හා භායන්ති.

6. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. ගවයෝ පාරේ දුවති.
ii. සොරු ගමේ ඇවිදිති.
iii. කපුටා ගසෙන් ඉගිළුණේය.
iv. පණ්ඩිතයන්ගේ මැණික් වෙළෙන්දෝ ගත්හ.
v. ඇස් ඇත්තා උදෑසන සිල්වතුන් බලයි.
vi. ධනවතා හිමාලයෙන් සිංහයකු ගෙනාවේය.
vii. පුරුෂයා වී දුන්නේය.
viii. රජුගේ අතේ කඩුවක් තිබේ.
ix. වඳුරෝ ගෙඩි කති.
x. අම්මා බත් පිසුවාය.

අත්තනොව අවෙක්ඛෙය්‍ය, කතානි අකතානි ච

**තමා කළ නොකළ දෙය විමසා බැලිය යුතු ය.**

**(ධම්මපදපාළි, පුප්ඵවග්ග, 7 ගාථාව)**